**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 11 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දිනද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අක්කර 1 පර්. 6 කින් යුතු වීරඹුගෙදර සෙන්ට් බ්‍රිජට්වත්ත ඉඩම අත්පත් කර ගැනීමේදී දරා තිබූ රු. 224,900 ක නොතාරිස් ගාස්තු ප්‍රාග්ධනීත කර නොතිබුණි. | නොතාරිස් ගාස්තු ඉඩමේ අගයට ප්‍රාග්ධනීත කළ යුතු වේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වටිනාකම රු. 2,030,195 ක් වූ පොතුහැර නාඹරුවාකන්ද ඉඩමේ වටිනාකම දෙවරක් ගිණුම්ගතකර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම්වල අගය වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වටිනාකම රු. 420,000 ක් වූ ඉඩම් 06 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | 2020 ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (ඈ) | රු.16,380,000 ක් වටිනා බැකෝ ලෝඩරයේ වටිනාකම රු.1,600,380 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා මෝටර් කරත්තවල වටිනාකම රු.14,779,620 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි අගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙය නිවැරදි කිරීමට පියවර ගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත වර්ෂ අවසානයේ ගෙවිය යුතු මුදල රු. 8,136,370 ක් වුවත්, එය අවසන් ගිණුම්වල රු. 8,095,047 ක් ලෙස දක්වා තිබීමෙන් ජංගම වගකීම් රු.41,323 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි අගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිණුම් තැබීමේදී සිදු වී ඇති වරදක් බැවින් එය නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ බිල් කිරීම් මුදල රු. 86,930,475 ක් වුවත් එය අවසන් ගිණුම්වල රු. 77,919,492 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි අගය ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේදී පළාත් පාලන දෙපාර්තුමේන්තුව මඟින් බඳවාගත් සේවකයින්ගේ වැටුප් ප්‍රතිපූර්ණය නොකළ මුදල ගිණුම්ගත නොවීම හේතුවෙන් මෙම වරද සිදුවී ඇත. මෙය නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (උ) | මූල්‍ය ප්‍රකාශනවල එක් ගිණුම් විෂයයකට අදාළ ශේෂයන් හා ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 884,154 ක නොසැසඳීම් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | ගිණුම්වලට තොරතුරු ලබාදීමේදී සිදුව ඇති වරදක් බැවින් එය නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (ඌ) | මූල්‍ය ප්‍රකාශන හා තොග සමීක්ෂණ වාර්තා අනුව ස්ථාවර වත්කම්වල රු.1,448,750 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | එය නිවැරදි කිරීමට පියවර ගනිමි. |
| (එ) | වටිනාකම රු. 81,968,032 ක් වූ ගිණුම් විෂයයන් 7 ක් සඳහා ලේඛන හා විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශනය සමඟ අදාළ උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

## 1.4. අනුකූල නොවීම්

------------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| 218 වගන්තිය | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණ සිදු කර නොතිබුණි. | සභා දේපළ සමීක්ෂණ කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතුවේ. | මින් ඉදිරියට සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණය සිදුකරන බවට කාරුණිකව දන්වමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 8,851,967 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 24,467,415 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 වර්ෂය ඇස්තමේන්තුගත ආදායම් රු. 000 | බිල්කළ ආදායම් රු. 000 | රැස්කළ ආදායම් රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 | 2018 වර්ෂය ඇස්තමේන්තුගතආදායම් රු. 000 | බිල්කළ ආදායම් රු. 000 | රැස්කළ ආදායම් රු. 000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. 000 |
|---|---|---|---|---|---|---|---|---|
| I. වරිපනම් හා බදු | 11,776 | 12,644 | 11,485 | 10,854 | 11,021 | 11,021 | 5,795 | 9,695 |
| II. කුලී | 9,713 | 8,876 | 8,781 | 4,296 | 8,819 | 8,819 | 9,907 | 4,201 |
| III. බලපත්‍ර ගාස්තු | 701 | 1,061 | 1,061 | - | 651 | 396 | 867 | - |
| IV. වෙනත් ආදායම් | 17,500 | 209,257 | 169,790 | 80,728 | 18,630 | 18,630 | 45,487 | 41,261 |
| එකතුව | **39,690** | **231,838** | **191,117** | **95,878** | **39,121** | **38,866** | **62,056** | **55,157** |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමලෝචිත වර්ෂයේ ආරම්භයේදී පැවැති රු. 9,694,651 ක් වූ වරිපනම් හා බදු හිඟයෙන් දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් අයවීමට පැවති හිඟය රු. 6,749,715 ක්ව පැවතුණි. | ඉකුත් වර්ෂය වෙනුවෙන් තවදුරටත් අයවීමට පැවති හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී දේපල තහනම් වැඩසටහන් හා හිඟ ආදායම් එකතු කිරීමේ ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කර හිග අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**2.2.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දීර්ඝ කාලයක සිට පැවත එන වත්කම් ඒකක 06 කට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 369,200 ක් අයවීමට පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතුවේ. | හිඟ මුදල් අය කිරීම සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක මහතුන්ට ලිඛිතව දැනුම් දී ඇත. |
| (ආ) | පොදු වෙළඳපොළ පැරණි කඩ කාමර ඉවත් කරන ලද අවස්ථාවේ පැවති රු.1,116,962 ක හිඟ ශේෂයෙන් රු.972,012 ක මුදලක් තවදුරටත් අයවීමට පැවතුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අය කිරීම සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක මහතුන්ට ලිඛිතව දැනුම් දී ඇත. |

### 2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1986 වර්ෂයේ සිට කුලියට ලබා දී තිබූ ආදර්ශ නිවාස 8 ක් ඉතා සුළු මාසික කුලී මුදලක් අය කරමින් පැවතුණි. | නව තක්සේරුවක් සිදුකර ඒ අනුව නිවාසකුලී අය කළ යුතුවේ. | බිම් කුලිය නැවත තක්සේරු කිරීමට මහා සභාවේ එකඟතාව ලබා ගෙන, 2020 වර්ෂයට තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, නව තක්සේරුව ලැබුණු පසු, ඒ අනුව ගිවිසුම් අත්සන් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට පැවති ලැබිය යුතු ගිණුම් ශේෂවල වර්ෂයක කාලය ඉක්මවා තිබූ රු.5,130,322 ක ශේෂ පැවතුණි. | හිඟ ශේෂ අයකරගත යුතු වේ. | වර්ෂ 01 කාලය ඉක්මවා තිබූ රු.5,130,322 ක ලැබිය යුතු ගිණුම් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පැවති ගෙවිය යුතු ගිණුම් ශේෂවල වර්ෂයක කාලය ඉක්මවා තිබූ රු.2,076,527 ක ශේෂ පැවතුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂයක කාලයක් ඉක්මවා තිබූ රු.2,076,527 ක වගකිව යුතු මුදල් නිරවුල් කිරීමට පියවර ගනිමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලයේ තෘතීයික මට්ටමේ පුරප්පාඩු 02 ක් ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 11 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 19 ක් පැවති අතර තනතුරු 06 කට අදාළව අනියම් සේවකයින් 29 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව බඳවාගෙන ඇත. |

### (ආ) සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය හැරයාම මත එක් නිලධාරියෙකුගෙන් රු.37,032 ක ණය මුදලක් අයකර ගැනීමට තිබුණි. | අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ණය හිඟය සම්බන්ධයෙන් අදාල නිලධාරියා දිගින් දිගටම දැනුවත් කර ලිපි සහ අවසන් නිවේදනයක් ද යවන ලදි. ඇය කොටස් වශයෙන් ගෙවන බවටද ලිපියක් ලබා දී ඇත. නමුත් මේවන තෙක් ගෙවීම් කර නොමැත. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු. 3,000 ක මුදලකට බදු දී තිබූ බස් නැවතුම්පල අංක 20 කඩ කාමරය බදුකරු විසින් වෙනත් පුද්ගලයෙකුට අතුරු බදු දී තිබුණි. | විධිමත් පරිදි කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්තුමාගේ 2019/02(01) අනුව ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**---------------------------**

**3.4.1 පවරා නොගත් වත්කම්**

**---------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව භුක්ති විඳින වත්කම් 12 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඇතැම් වත්කම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 16 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව සතුවී ඇති අතර අනෙකුත් වත්කම් ඉදිරියේදී නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කරමි. |